**කීර්තිමත් ආදි ඉසිපතනුවෙක් හඳුනාගනිමු.**

ඉසිපතනය නම ඇසුණු සැනින් වැඩිදෙනා අප හඳුනන්නේ රගර් ක්‍රීඩාවට ප්‍රසිද්ධ පාසලක් ලෙසය. ඒ රගර් ක්‍රීඩාවට අප පුතනුවන් සහජ හපනුන් නිසාය. නමුත් ඉසිපතනය තුළින් බිහිවී ඇත්තේ රගර් හපනුන් පමණක්ම නොවේ. ක්‍රිකට්, මළලක්‍රීඩා, හොකී, ටෙනිස්, ජිම්නාස්ටික් ආදී අනෙකුත් ක්‍රීඩා ඉසව් වලින් සුවිශේෂී දක්ෂතා දැක්වූ ක්‍රීඩකයන්ද, සංගීත, නාට්‍ය, කලා සහ සාහිත්‍ය ක්ෂේත්‍රවල නිපුණයන් ද, නිර්මාණශිල්පීන් සහ විශේෂ දක්ෂතා ඇති වෘත්තිකයන් ද, දක්ෂ ව්‍යාපාරිකයන් මෙන්ම රටට වැඩදායී උගතුන් ඇතුළු ලාංකීය ජන සමාජය සුපෝෂණය කළ හැකි උදාර ශ්‍රී ලාංකිකයන් රැසක්ම සමාජයට බිහිකර ඇත.

මෙම තීරය යටතේ ඉසිපතන මාතාව සමාජයට දායාද කළ එවන් කීර්තිමත් ඉසිවර පුතනුවන් වරින්වර හඳුන්වා දීමට අදහස් කරමි.

මෙමගින් ඔවුන් ඇගයීමට ලක් කිරීමත්, එමඟින් පාසල සහ ඔවුන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධය වැඩිකිරීමත්, වත්මන් සිසුන්ට ඔවුන් ආදර්ශයක් කරගැනීමට අවකාශ සැලසීමත් අදහස් කෙරේ.

මේ පෙළගැස්වීමේ පළමු පියවර ලෙසට ශ්‍රේෂ්ඨ ඉසිපතනුවෙක් ලෙස පාසලටත්, සමාජයටත් සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන ජගත් අල්විස් මැතිඳුන් ඔබට හඳුන්වාදීමට කැමැත්තෙමි.

**නන්දන බැස්ටියන්ස්**
"ඉසිනද" ප්‍රධාන මාධ්‍ය සම්බන්ධීකාරක